10/07/2011 - ඉරිදාලංකාදීප

**රටට වැදගත් වන ජාත්‍යන්තර දර්ශක - මිලින්ද මොරගොඩ**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය අලුත් යුගයක් හමුවේ සිටී. ප්‍රජාතන්ත්‍රවාදය හා විවෘත ආර්ථික ක්‍රමය සම්බන්ධ දීර්ඝ කාලීන අත්දැකීම් ඇති අප රටට මෙම යුගය හමුවන්නේ අලුත් අවස්ථා සහිතවය. යුධ කාලපරිච්ඡේදය තුළ මෙවැනි අවස්ථා හමුවේ ක්‍රියාශීලීවන්නට තිබුණ හැකියාව සීමිත එකකි. ප්‍රමුඛතාවය ලැබුණේ ආරක්ෂාවටය. ආර්ථික සංවර්ධනය හා එයට අවශ්‍ය ප්‍රතිසංස්කරණ වෙනුවට රටේ පැවති තත්ත්වය හමුවේ විකල්ප සීමාසහිත විය. යුද ගැටුම් අවසන්වීම අලුත් අවස්ථාවකි. ජාත්‍යන්තර ආර්ථිකය පැවති අර්බුද වලින් නික්ම යළි ගොඩ නැගෙන විට එය අලුත් යුගයකි.

අද ආර්ථික රටාව සංකීර්ණ එකකි. එහි අභියෝග එකිනෙකට වෙනස්ය. තරඟකාරීත්වය, කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය එහි පදනමයි. අප රට තුළ ව්‍යාපාර, කර්මාන්ත හා සේවා අංශ ද එකී පදනම අනුව ගොඩනගා ගත යුතුය. ශ්‍රී ලංකාව අඩු ආදායම් ලබන රටක සිට මැදි ආදායම් ලබන රටක ශ්‍රේණියට පත්ව තිබේ. මෙම වර්ධනයට ආර්ථිකයේ පවතින ස්වභාවය හේතුවිය. යුධ කලබලවලින් මිදීම එහි පළමු සාධකයයි. දෙවනුව යම් යම් ප්‍රතිසංස්කරණ බලපාන්නට ඇත. දළ දේශීය නිෂ්පාදිතය සියයට අටක වැඩි වර්ධනයක් සහිතව වසර 2016 වන විට මෙරට ජනතාවගේ ඒක පුද්ගල ආදායම දෙගුණයක් දක්වා වැඩි කර ගැනීම රජයේ ඉලක්කයයි. එය පහසු නැත.

අද ඇති පළමු අවශ්‍යතාවය අපනයන අංශය කැපී පෙනෙන වර්ධනයක් ලඟාකර ගැනීමයි. මෙරට නිෂ්පාදන ආසියානු සැපයුම් ජාලය සමග සම්බන්ධවීම එහිලා වැදගත්ය. ජාත්‍යන්තර ආර්ථිකයේ බල කේන්ද්‍රය බටහිර සිට නැගෙනහිර කලාපයට මාරුවෙමින් තිබේ. ශ්‍රී ලංකාව තම අපනයන වලින් වැඩි ප්‍රතිශතයක් දැනට යවන්නේ බටහිර හා යුරෝපීය කලාපයටය. එය මෙරට අපනයන වලින් සියයට හැටක පමණ ප්‍රමාණයකි. ලෝක ආර්ථික වර්ධනයෙන් අඩකට වඩා දායක වන ඉන්දියාව හා චීනයට මෙරටින් නිර්යාථ කරන භාණ්ඩ ප්‍රමාණය සමස්ථ අපනයන වලින් දහයෙන් පංගුවකි. රටට කැපී පෙනෙන ආර්ථික වර්ධනයක් උදෙසා අපනයන වර්ධනය කර ගත යුතු අතර මෙම නොසලකාහැර ඇති බව පෙනෙන අලුතින් දියුණු වන ආසියාව දෙස වඩා අවධානයක් යොමු කිරීම අවශ්‍යය.

ලෝක ආර්ථිකයේ තරඟකාරීත්වයට ඇතුළුවන්නට උත්සාහ නොකළ යුගයට වඩා අද එළැඹෙන කාල පරිච්ඡේදය සංකීර්ණ එකකි. ආයෝජන ඇරඹීම, ව්‍යවසායකත්ව දියුණු කිරීම සූක්ෂම අවස්ථාය. රජයට පමණක් ආයෝජනය කළ නොහැකිය. ව්‍යාපාර මෙහෙයවීම රජයට පමණක් කළ හැක්කක් නොවේ. යුද්ධය පවතින අවස්ථාවක රජයේ බලය කේන්ද්‍රගත වෙයි. රාජ්‍ය ආරක්ෂාව, ආරක්ෂක අංශ මෙහෙයවීම හා අවි ආයුධ පරිහරණය රජය පමණක් සතු අයිතියකි. රජය ක්‍රියා කරන්නේ ආරක්ෂාව පළමු තැනෙහි පවත්වාගනිමිනි. සාමය උදා වී ආර්ථිකය ශක්තිමත් කිරීමේ දී රජයේ බලය අඩු කර ක්‍රියාත්මකවීමේ අවස්ථාව සමාජයට දිය යුතුය. සෑම පුද්ගලයෙකුම ව්‍යවසායකයෙකු බවට පත්වීම අවශ්‍යය. සමාජයේ සියලුම දෙනා නිපදවන්නන් වන විට අළෙවිකරුවන් වන විට අලුත් අලුත් දේ සොයා යන විට ආර්ථිකයක් සක්‍රීය වෙයි. නිපැයුම වැඩි වනවිට අපනයනයට අවස්ථාව සැකසෙයි. ව්‍යාපාර පවත්වාගෙන යාමට සුදුසු පරිසරයක් රටට අවශ්‍යය. ඉක්මනින් තීරණ ගන්නා, අනවශ්‍ය බාධා කිරීම් නැති, සරල බදු ක්‍රම හා දුර දක්වා ප්‍රතිපත්ති ඇති අවස්ථාවක ආයෝජන ඉහළ යයි. මහජනතාව තමන් සතු මුදල ආයෝජනය කරන්නට ඉදිරිපත් වෙයි.

වර්තමාන ලෝකයේ මෙවැනි ආයෝජන හිතකර පරිසර ඇති නැති බව මනින පිළිගත් දර්ශක ඇත. දෙස් විදෙස් ආයෝජකයන් මෙම දර්ශක දෙස බලා තීන්දු ගනිති. රටක ආයෝජනය කරන්නට පෙර එකී රට තුළ ආරක්ෂාව, දේශපාලන ස්ථාවරත්වය හා ව්‍යාපාර සඳහා හිතකර පරිසරය සොයා බලති. Ease of Doing Business index එවැනි එක් දර්ශකයකි. අලුත් වර්ග කිරීමට අනුව රටවල් 181 ක ලැයිස්තුවක ශ්‍රී ලංකාව සිටින්නේ 102 වැනි තැනය. ලැයිස්තුවේ මුලට ඇති රටවල ව්‍යාපාර ආරම්භ කිරීම පහසුය. එහි දර්ශකයට අනුව පහළට ගමන් කරන විට ආයෝජනයට පහසු නැති බව පෙන්වයි. මෙම දර්ශක සකස් කරන්නේ එක් එක් රටවල අභ්‍යන්තරයේ තොරතුරු පරීක්ෂා කර සම්පිණ්ඩනය කිරීමෙන් පසුවය. මුදල් අමාත්‍යංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව එකතුවී මෙම දර්ශකයේ

පළමු රටවල් තිහ තුළට ශ්‍රී ලංකාවේ නම එකතු කිරීමේ වැඩ සටහනක් අරඹා තිබේ. එවැනි සැලසුමක් ඉතාමත් වැදගත්ය. නිසි කැපවීමකින් හා මග පෙන්වීමකින් පසු ආයතනික ආකල්ප වෙනස්කළ හැකිය. තීරණ ගන්නා ආකාරය වේගවත් කළ හැකිවෙයි. ඒ මගින් ව්‍යාපාර හා ආයෝජන හිතකර රටක් බවට පත් කිරීමට ඉඩ සැලසෙයි.

අන්තර්ජාතික ලොජෙස්ටික් තත්ත්ව දර්ශකයක් ද තිබේ. අමුද්‍රව්‍ය ආනයනයේ සිට නිමි භාණ්ඩ පාරිභෝගිකයා අතට පත්වන අවස්ථාව දක්වා අභ්‍යන්තරයේ ඇති මෙහෙයුම එයින් ආවරණය වෙයි. වරාය මෙහෙයුම, භාණ්ඩ ප්‍රවාහනය, භාණ්ඩ නිසි ප්‍රමිතියට ගබඩා කිරීම හා මෙම අංශ වල කාර්යක්ෂමතාව මෙහිලා සැලකිල්ලට ගැනේ. නිවැරදිව අන්තර් ජාතික තත්ත්ව යටතේ ක්‍රියාත්මකවීම සහ ඵලදායීතාව ගැන සැලකිලිමත්වීමෙන් භාණ්ඩයේ ගුණ ආරක්ෂාවීම හා අඩු නිෂ්පාදන වියදම ඇති කරන බව පිළිගැනීමයි. ශ්‍රී ලංකාව මෙම Logistics Performance Index දර්ශකය අනුව පසුවන්නේ 137 වැනි ස්ථානයේය. 2009 දී රටවල් 154 ක් අතුරින් එම ස්ථානය දිනා ඇති බව පෙන්වන්නේ මෙරට රේගුව, වරාය යටිතල පහසුකම්, ලොජෙස්ටික් තරඟකාරීත්වය, නැවුගත කිරීම, භාණ්ඩ ලයින් කිරීම හා නැව්ගත කිරීමේ දී වැය වන කාලය සම්බන්ධ ගැටලු පවතින බවය. ආසියානු කලාපයේ ඌන සංවර්ධිත තත්ත්වයක ඇති බංග්ලාදේශය මෙම දර්ශකයේ ශ්‍රී ලංකාවට වඩා ඉහලින් සිටී. එය සැළකිල්ලට ගත යුතු කරුණකි.

ආයෝජනයට හිතකර පරිසරය හා ලොජෙස්ටික් යන දර්ශක පෙන්වන තත්ත්ව සැළකියයුතු මට්ටමක නැති නම් ආයෝජන දිනා ගැනීම පහසු නැත. ලෝකයේ ආයෝජනයට අවස්ථා සොයමින් යන සමාගම් යුද ගැටුම් වලින් පසු පිබිදෙන ශ්‍රී ලංකාව අලුත් අවස්ථාවක් ලෙස උනන්දුවන නමුත් මෙවැනි දර්ශක ආයෝජකයන්ට තීරණ ගැනීම දුර්මුඛ කරයි. විදේශීය සමාගම්, ආයෝජන අරමුදල් පමණක් නොව මෙරට සාමාන්‍ය ව්‍යවසායකයෙකුට පවා රට තුළ කුඩා ව්‍යාපාරයක් හෝ අරඹන්නට නිසි වාතාවරණයක් පවත්වා ගෙන යාම අවශ්‍යය.

ලොජෙස්ටික් දර්ශකය පෙන්වා දෙන ප්‍රධාන කරුණක් වන්නේ රේගුවේ භාණ්ඩ නිශ්කාශනය ආශ්‍රිතව පවතින ගැටලුය. ශ්‍රී ලංකාවේ වරාය හා රේගු කටයුතු ප්‍රතිසංස්කරණයකට ලක්කළ යුතුය. ආරක්ෂිත තත්ත්ව යටතේ පැවති යුගයට වඩා වෙනස් අන්දමට වර්තමානයේ මෙම අංශ ක්‍රියාත්මකවීම වටී. කලාපයේ රටවල් අතර ඉන්දියාව හා බංග්ලාදේශය වැනි රටවල මෙවැනි අංශ හඳුන්වා දී ඇති ප්‍රතිසංස්කරණ වෙළඳාම දියුණු කිරීමේ දී අවශ්‍ය ම සාධකයකි. නව ප්‍රතිපත්ති, අලුත් වරාය මෙහෙයුම් පටිපාටි, පරිගනකගත තාක්ෂණය සහ අවදානම කළමනාකරණය වැනි අංශ කාලානුරූපව ප්‍රතිව්‍යුහගතවීම අවශ්‍යය. එවැනි අලුත් ව්‍යුහාත්මක වෙනස්කමකට ගමන් කරන තෙක් මෙරට ව්‍යාපාර හා කර්මාන්ත වල නිෂ්පාදන අපනයනයේ දී හේ අමුද්‍රව්‍ය හා යන්ත්‍රසූත්‍ර ආනයනයේ දී ව්‍යවසායකයෝ පසුබෑමකට ලක්වෙති. තියුණු තරඟකාරීත්වයක් ඇති වෙළඳාමේ දී තරගකාරී සැපයුම්කරුවන් සමග කටයුතු කිරීමේ දී අවාසි වන විට ව්‍යාපාර අලාභ ලබන තත්ත්වයට පත්වීම වැලැක්විය නොහැකිය. එය රටට හිමිවන අපනයන අවස්ථා, රැකියා උත්පාදනය හා අවසානයේ දී රටට ආදායම උපයන මාර්ග දුර්වල කරනු ඇත. වරාය දක්වා භාණ්ඩ ප්‍රවාහනයට ඇති පහසුව ද මෙහිලා තීරණාත්මකය. මහා මාර්ග තදබදය, දුම්රිය ප්‍රවාහනය ප්‍රමාණවත් අන්දමින් ව්‍යාප්ත නොවීම නිෂ්පාදකයන් හා අළෙවිකරුවන් මුහුණ දෙන ගැටලු වශයෙන් සැලකේ. පසුගිය කාලය තුළ මාර්ග ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනයට විශාල ආයෝජනයක් කරන ලද නමුත් කලාපයේ හා ලෝකයේ වේගවත් සංවර්ධනය සමග සසඳන විට එය ප්‍රමාණවත් නැත. භාණ්ඩ ප්‍රවාහන වියදම අඩු කළ හැකි නම් එහි අවසාන වාසිය හිමිවන්නේ පාරිභෝගිකයන්ටය. රේගු හා වරාය මෙහෙයුම් කලාප පිහිටුවා මෙම සේවා ඉක්මන් කිරීමට රජය මැදිහත්විය යුතුය. භාණ්ඩ ගබඩා ඇතිකළ යුතුය. ඉක්මනින් පරීක්ෂා කර නැවුගත කිරීමට හෝ අයිතිකරුවන්ට භාර දීමට හැකි පරිසරයක් ඇති කළ යුතුය. එවැනි වාතාවරණයක් ඇති කිරීමට අපොහොසත් වන විට දැන් තත්ත්වය ඉහළ නංවමින් සිටින ඉන්දියානු වරාය දෙසට නැව් මාර්ග යොමු වීමට ඉඩ තිබේ. එවිට ශ්‍රී ලංකාවේ මෙහෙයුම් පහත වැටෙනු ඇත. කොළඹ වරායේ තත්ත්වය කාර්යක්ෂම කර වටිනාකම කැපීපෙනෙන සේවා වටපිටාවක් ඇතිකළහොත් ආසියාවේ ලොජෙස්ටික් කේන්ද්‍රයක් බවට පත් කළ හැකිය.

අපනයනය වර්ධනය කර වෙළඳාම පැත්තෙන් වැඩි ප්‍රතිලාභ ලබන්නට ශ්‍රී ලංකාවට අවස්ථාවක් තිබේ. මෙම දර්ශක පෙන්වන කණගාටුදායක චිත්‍රය වෙනුවට කාර්යක්ෂම සුපිරිසිදු සේවාවක් ඇති කරන්නට අපට හැකිය. මෙතෙක් කාලයක් මෙවැනි පැති ගැන අවධානයක් නොදක්වා නොසැලකිල්ලෙන් මෙහෙයවීම අද පවතින දුර්වලතාවයට හේතුව බව අවබෝධ කර ගත යුතුව තිබේ. කොළඹ වරාය මෙන්ම බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළ ද භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් වැදගත්ය. ලොජෙස්ටික් දර්ශකයට ගැනෙන මෙම අංශ ආවරණය වන්නේ බස්නාහිර පලාතටය. අද බස්නාහිර පලාත රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් හරි අඩකට දායකත්වය සපයයි. පලාත් ගණනාවක් දක්වන දායකත්වය සුළු එකකි. රජය මෙම වරාය හා ගුවන්තොටුපොළ සේවා දකුණු පලාතට ද ව්‍යාප්ත කිරීමේ අරමුනින් ක්‍රියා කරන බව පෙනේ. එය රජයට පමණක් ඉතා ඉක්මනින් කළ හැකි සංවර්ධනයක් නොවේ. වරාය හා ගුවන් සේවා ව්‍යාප්තියට කාලයක් ගතවෙයි. පුද්ගලික අංශය ද මෙම අංශ වල ට දායක කර ගත හැකිය. වරාය හා ගුවන්තොටුපොල ලොජෙස්ටික් සැපයීම විශාල කාර්ය භාරයකි. නිවැරදිව, කාර්යක්ෂමව පාරිභෝගිකයා අතට උසස් තත්ත්වයේ භාණ්ඩයක් අඩු වියදමකින් සැපයීම අභියෝගයකි. එය රජයට පමණක් කරන්නට හැකියාවක් ද නැත. දේ විදෙස් ව්‍යවසායකයන් මෙම අංශය වටා එකතු විය යුතුය. එවිට සේවා සපයන්නන් වැඩි වී තරගකාරීත්වයක් නිර්මාණය වෙයි. රජය තමන්ට කළ හැකි ප්‍රතිපත්ති හා නීති රීති සම්පාදනය වැනි අංශ තෝරා ගත යුතුය. කළමණාකරනය හා සේවා සම්පාදනයට පුද්ගලික අංශයේ ව්‍යවසායකයන්ට අවස්ථාව දිය හැකිය. වර්ධනය වන එකී ව්‍යාපාර වලින් බදු අය කර ගත හැකි අතර රටට අවශ්‍යම රැකියා අවස්ථා ජනනය වීම විශාල පහසුවකි. ස්ථාවර හා නම්‍යශීලි ප්‍රතිපත්ති අනුව මෙම ලොජෙස්ටික් අංශ දියුණුවන විට ශ්‍රී ලංකාව හා ජාත්‍යන්තර වෙළඳපොළ සම්බන්ධ කිරීම පහසුවන අතර එයින් අවසාන දියුණුව ලැබෙන්නේ රටට හා සමාජයටයි.

ශ්‍රී ලංකාවේ අපනයන විශේෂයෙන් ඇගලුම් නිෂ්පාදකයන් මෙරට දැන් පවතින ලොජෙස්ටික් පහසුකම් වල තත්ත්වයට ගැලපී සිටිති. රෙදි තොග වරායෙන් නිදහස් කරගෙන, අනුමත කරන ලද සාම්පල් වලට අනුව කරන ලද නිෂ්පාදන නියමිත දිනට ඇනවුම්කරුවන් අතට පත්කිරීම පහසු නැත. උසස් තත්ත්වය හා කාලය ප්‍රශ්නයක් නොවන ඇනවුම් පවතිනතාක් කල් දැන් ඇති වරාය හා රේගු පහසුකම් සහ ප්‍රවාහන ප්‍රශ්න ඉවසාගත හැකිය. තරගකාරී සැපයුම්කරුවන් සමග තරගකරන්නට නම් මෙම තත්ත්ව සැලකිය යුතු තරමින් වැඩි දියුණු කළ යුතුය. දැනට ලැබෙන වාර්තා අනුව ඇතැම් ඇගලුම් අපනයනකරුවන් තමන්ගේ නිෂ්පාදන නියමිත දිනයට ගැනුම්කරුවන් වෙත යැවීමට ගුවන් භාණ්ඩ ප්‍රවාහනය වැනි වියදම් අධික පැති වලට පවා යොමු වී තිබේ. වරායට ගෙන ඒමට ඇති ප්‍රශ්න, වරායේ ප්‍රමාද සහ ඉක්මනින් ලිපි ලේඛන පරීක්ෂා කර නිසි පරිදි නිදහස් කිරීමේ ක්‍රමවේද ඇත්නම් එවැනි උපාය අවශ්‍ය නැත.

රට දියුණු කිරීමට ආයෝජනය නැංවීම අවශ්‍යය. ව්‍යාපාර ඇති කර ව්‍යවසායකත්වය වර්ධනය කළ යුතුය. ඒ වෙනුවෙන් අවශ්‍ය පසුබිම සකස් කිරීම අපගේ අවශ්‍යතාවයකි. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ලංකාවේ තත්ත්වය නරක නම් අපට එය පාඩමකි. නව සැපයුම් හා නව අදහස් අනුව ප්‍රතිව්‍යුහකරණයකට අවස්ථාවකි. රට දියුණු වන විට ජාත්‍යන්තරයේ ඇති නව ප්‍රවනතා වලට අනුකූලවීම ඒ කෙරෙහි සැලකිලිමත් වීම වැදගත්ය.